# විද්‍යා සන්නිවේදනයේ බලපෑම කෙබඳු ද?

මහාචාර්ය කාලෝ ෆොන්සේකා

මහජනතාවට විද්‍යාව සන්නිවේදනය කිරීම සඳහා සම්පත් මහත් රාශියක් ආයෝජනය කිරීමෙන් අනතුරුව එකී කාර්යය ඉටු කිරීම සඳහා අප ගත් උත්සාහයන්ගෙන් කිසියම් බලපෑමක් මහජනතාවට සිදු වී ඇත්දැයි සොයා බැලීමට කාලය පැමිණ ඇත. දේශන පැවැත්වීම, පුවත්පත්වලට ලිපි සැපයීම, ගුවන් විදුලිය ඔස්සේ කතා පැවැත්වීම, රූපවාහිනී වැඩසටහන්වලට සහභාගි වීම, ප්‍රදර්ශන සංවිධානය කිරීම යනාදියෙන් අපි ජනතාව වෙත විද්‍යාව ගෙන යාමට උත්සාහ දරමින් සිටිමු. මේ සියල්ලෙහි බලපෑම කෙබඳුද? විද්‍යාව සන්නිවේදනයෙහිලා අපගේ ප්‍රතිපත්ති ජනතාව වෙත ඇති කෙරෙන බලපෑම කුමක් වන්නට ඇත්ද?



මානව පරිණාමය

විද්‍යාත්මක යෙදවුම් පුළුල් ලෙස භාවිතයට ගන්නා රට ඇමරිකාව බව කිසිදු සැකයක් නොමැත. ගුවන්විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, ඩිජිටල් කැමරා, අහස් යාත්‍රා, පරිගණක, ක්ෂුද්‍ර තරංග උදුන් සහ ගිණිය නොහැකි විවිධ දෑ ද ඇතුළත්ව විද්‍යාත්මක යොදාගැනීම් භාවිතය අතින් ලොව අන් රටවල් අතරින් පෙරමුණේ සිටින්නේ ඇමරිකාවය. දැනට වසර කිහිපයකට පෙර ඇමරිකා එක්සත් ජනපදයේ සිදු කරන ලද සමීක්ෂණයකට අනුව එකී සමීක්ෂණයට දායක වූවන් අතරින් 76%ක් අවුරුදු 6000කට පෙර ලෝකය මවා ඇති බව විශ්වාස කරති. එවැනිම වූ ප්‍රතිශතයක් සුරදූතයන්, භූතයින්, සහ යක්ෂයින් පිළිබඳ විශ්වාස කරති. ඇමරිකා වාසීන්ගෙන් 79%ක් දෙනා හාස්කම් පිළිබඳ විශ්වාස කළහ. හාස්කම් සත්‍යයක් නම් එය ස්වභාවධර්මයේ නීති උල්ලංඝනය කිරීමක් වේ. ලෝකයේ සත්ව සහ ශාක සන්තතියේ ඇදහිය නොහැකි විවිධත්වය පිළිබඳ අනර්ඝතම පැහැදිලි කිරීම වන චාල්ස් ඩාවින්ගේ ජෛව පරිණාමය පිළිබඳ සිද්ධාන්තයේ වලංගු භාවය පිළිගනු ලබන්නේ ඇමරිකානුවන්ගෙන් 15%ක් පමණි. එදිනෙදා ජීවිතය කෙරෙහි විද්‍යාවෙහි බලපෑම විශිෂ්ටතම වන්නාවූ ඇමරිකාවේ සත්‍ය වශයෙන්ම පවතින තත්වය එයයි. එසේ හෙයින්, ජනතාව වෙත විද්‍යාත්මක දැනුම සන්නිවේදනයෙහිලා විද්‍යාඥයින් විසින් ගනු ලබන උත්සාහයන්ගේ සැලකිය යුතු බලපෑමක් කොහෙත්ම තිබේද යන ප්‍රශ්නය පැන නගී.

ඇමරිකාවේ ජනතාව කෙරෙහි විද්‍යා සන්නිවේදනය මගින් සිදු වන බලපෑම නොසැලකිය යුතු මට්ටමක තිබෙන්නේ ඇයිද යන්න වටහා ගැනීමට අප අයත් වන්නා වූ සහ තමන් විසින්ම ''හෝමෝ සේපියන්ස්'' ලෙස නම් කරනු ලබන්නාවූ විශේෂයේ සමාජ පරිණාමය පිළිබඳ අවධානය යොමු කිරීමට සිදුවේ. ඩෙස්මන්ඩ් මොරිස් විසින් රචිත ''නිරුවත් වානරයා'' නමැති ග්‍රන්ථයට අනුව දැනට ජීවත් වන වඳුරන් සහ වානර විශේෂ 193 දෙනාගෙන් එකකට අප අයත්වේ. මොවුන් අතරින් රෝම සහිත විශේෂ 192ක් ඇති අතර මිනිසා රෝම නොමැති එකම විශේෂය වේ. එහෙයින් මොරිස් විසින් ''හෝමෝ සේපියන්ස්'' විශේෂය හැඳින්වීමට ''නිරුවත් වානරයා'' යන වදන යොදා ගන්නා ලදී. ලෝකය පිළිබඳ විද්‍යාත්මක දෘෂ්ටියට අනුව ජීවයේ ආරම්භය සහ පරිණාමය මේ මිහිමත සිදු විය. එක් අවස්ථාවකදී මානව වර්ගයා පොළොව මත ජනිත විය. පූර්ව අවධියේදී ඔවුහු ''ඇන්ත්‍රපොයිඩයෝ'' වූහ. ඉන් අනතුරුව අපද අයත් වන ''හොමිනිඩ්'' බවට පත් වූහ. වාචික සන්නිවේදනයේ එක්තරා ස්වරූපයක් ''ඇන්ත්‍රපොයිඩයන්ගේ'' සිට ''හොමිනිඩයන්'' දක්වා පරිවර්තනය වීම සලකුණු කළ බවට සාක්ෂි තිබේ. අනෙක් සියලුම වඳුරන් සහ වානරයන් එකිනෙකා සමග සන්නිවේදනය කළේ මොරදීමෙන් සහ අංගචලනයෙනි.



වඳුරන්, බැබුනයන්, සහ ගොරිල්ලන් ආදීහු, ශබ්ද, මොරදීම, සහ අංග චලනයෙන් එකිනෙකා සමග සන්නිවේදනය කරනු ඔබ දැක ඇත. මුල්ම යුගයේ මෙකී පරිවර්තන කාලය තුළ මානව වර්ගයා ශබ්ද සහ මොරදීම්වලින් ඔබ්බට ගිය යම් ආකාරයක වාචික සන්නිවේදනයක් ගොඩනගාගත් බව පෙනෙන්නට තිබේ. සමහර විද්‍යාඥයන්ට අනුව, මානව වර්ගයා සහ අනෙක් සතුන් අතර ප්‍රධාන වෙනස්කම, අන් සමහරුන් විශ්වාස කරන ආකාරයට 'උපකරණ භාවිතය' නොව, මෙකී 'වාචික සන්නිවේදනයයි'. මේ මතයට අනුව, අප අපවම නම් කරනු ලැබීමට ලැදියාවක් දක්වන ''හෝමෝ සේපියන්ස් (*Homo sapiens*)ගේ ලක්ෂණ නිර්වචනය කෙරෙන්නේ භාෂාව භාවිතය මගිනි.





ලේඛන හැකියාව භාවිතයට පැමිණීමට බොහෝ කාලයකට පෙර සන්නිවේදනය සඳහා කථන භාෂාව භාවිතයට පැමිණ ඇත. පහළ ප්‍රිමාටාවන් වන ඔරං ඔටං, චිම්පන්සි, ගිබන් සහ ගොරිල්ලන්, අංකුර වාචික සන්නිවේදන ස්වරූපයක් වූ මොරදීම, සහ අංග චලන මගින් සන්නිවේදනය කළහ. අපට වැටහෙන පරිදි ඇන්ත්‍රපොයිඩයන්ගේ සිට මානවයා දක්වා සිදුවූ සංක්‍රාන්තිය භාෂාව භාවිතය මගින් සලකුණු කර ඇත.

පොළොව මත මිනිසාගේ පැවැත්ම අවුරුදු මිලියනයක් පමණ අතීතයට දිවයන බව ගණන් බලා ඇත. මෙම කාලයෙන් 99% ක්ම 'මිනිසා' ගත කර ඇත්තේ සමාජ පරිණාමයේ ''දඩයම්'' යුගය තුළය. මෙම යුගය තුළ, සතුන් දඩයම් කිරීමත්, පලතුරු සහ අල වර්ග ආහාර පිණිස එක් රැස් කිරීමත් ඔහුගේ ජීවන රටාව විය. ''දඩයම් යුගය'' තුළ පොළොව මත මානවයින්ගේ සංඛ්‍යාව බහුල නොවීය. ''හෝමෝ සේපියන්ස්'' අප්‍රිකාවේ ජනිත වූ බවත් ඉන් අනතුරුව ලෝකයේ වෙනත් ප්‍රදේශ කරා ව්‍යාප්ත වූ බවත් විශ්වාස කෙරේ. එකල මිනිස්සු 100කින් පමණ සමන්විත කුඩා ගෝත්‍රවල 'දඩයම්කරුවන්' ලෙස ජීවත් වූහ. එක් තැනක ආහාර සඳහා සතුන් හිඟ වූ විට ඔවුහු කැලයේ වෙනත් කොටසකට සංක්‍රමණය වූහ. එනිසා, එය 'තැනින් තැනට යන ජීවිතයක්', එනම්, ස්ථිර නවාතැනක් නොමැති ජීවිතයක් විය. මානව සමාජ පැවැත්මේ මුල්ම අවධි පිළිබඳ මානව විද්‍යාඥයන් පවසන්නේ මෙයයි.



චාල්ස් ඩාවින්

සමූහචාරී හෝ සමාජ සත්වයන් වූ නිසා, දඩයමින් ජීවත් වූ මෙම යුගයේ එක් කණ්ඩායමක සාමාජිකයන් අතර එකිනෙකා සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් විය. ඔවුන් දඩයමේ යන විට එකිනෙකා සමග සන්නිවේදනය කිරීම අනිවාර්ය විය. එනිසා, ජීවිතය සුරැකීමේ වටිනාකමක් භාෂාව සතු විය.

මානව වර්ගයා කෘෂිකර්මයට හුරු වූයේ අදින් වසර 10,000කට පමණ පෙරය. සරුසාර ඉඩම් සහ ජලය සපයා ගත හැකි බව කෘෂිකර්මය සඳහා මූලික අවශ්‍යතා ලෙස සැලකිය හැක. එනිසා, තැනින් තැනට යෑමට අදහසක් මිනිසුනට නොවීය. දඩයම් යුගයේදී මෙන් තැනින් තැනට යන නිදහසක් මෙකල මිනිසුනට නොවීය. එනිසා, සරුබිම් සහ ජලය සමග ස්ථාවර සන්තක ප්‍රදේශයක පදිංචිවීමේ නැඹුරුතාවයක් පෙනෙන්නට තිබිණි. අවශ්‍යතාවයක් ඇති වුවහොත් යම් කණ්ඩායමක මරණය දක්වා සටන් කිරීම මගින් වුවද රැක බලා ගැනීමට කැමැත්තක් දක්වන, 'නිජභූමිය, මාතෘභූමිය, හෝ පීතෘ භූමිය' යන හැඟීම උත්පාදනය විය. එමගින් නිජභූමිය පිළිබඳ සංකල්පය ඉතා තදින් මුල් බැස ගත්තේය. මෙම අවධියේදී ගෝත්‍රයක ඕනෑම සාමාජිකයෙකුට, විශේෂයෙන්ම පුරුෂයන්ට ප්‍රධාන යුතුකම් තුනක් තිබිණි. පළමුවැන්න, තමන් ආරක්ෂා වීමයි. මීළඟ යුතුකම වූයේ තමාගේ කුටුම්භය ආරක්ෂා කර ගැනීමයි. තෙවැන්න වූයේ තමන් අයත්වන ගෝත්‍රය සහ තමන් වාසය කරන සන්තක ප්‍රදේශය රැක ගැනීමයි. මෙය මානව සමාජ පරිණාමනයෙහි හරවත් කතාන්දරයයි. කෘෂිකර්මාන්තයේ ආරම්භයත් සමග ආහාර සැපයුම ඉහළ ගිය අතර ආහාර සැපයුම් මාර්ගය වඩා විශ්වාසදායී විය. ක්‍රම ක්‍රමයෙන් අනෙකුත් වෙනස්කම් සිදුවීම ආරම්භ විය. වඩා බලවත් සහ ශක්තිමත් මිනිසුන් විසින් දුර්වලයන් පාලනය කිරීම ඇරඹුනි. එය ඉඩම් හිමියන්ගේ සහ දාසයන්ගේ යුගයක ඇරඹුම විය. තම ආඥාව ඉටු කර ගැනීමට අනෙක් මිනිසුන් හට ප්‍රබල ලෙස අණ කළ හැකි බලවත් පුද්ගලයෙක් රජ බවට පත් විය. මෙය රාජාණ්ඩුවෙහි පටන් ගැනීම විය. රාජාණ්ඩු බිහිවීමත් සමග තමන්ගේ සම්ප්‍රදායක මාතෘ භූමියට වැඩිපුර සරුබිම් ඈඳා ගැනීම උදෙසා එයට යාබද ප්‍රදේශවල කණ්ඩායම් සමග සටන් වැදුනහ. මිනිසුන්ගේ මනස තුළ 'යුද්ධය' ආරම්භ වූයේ මෙලෙස විය හැකිය. දඩයම් යුගය තුළ මිහිමත ජීවත් වූයේ මිනිසුන් ටික දෙනෙකු බැවින් ගැටුම් හටගත්තේද සුළු වශයෙනි. පිටස්තරයින් තම සන්තක ප්‍රදේශය යටත් කර ගැනීම පිණිස සිදු කළ ආක්‍රමණවලදී එය ආරක්ෂා කර ගැනීමට අපොහොසත් වන්නේ නම් එහි වැසියෝ තම

සන්තක ප්‍රදේශය අතහැර වෙනත් ප්‍රදේශයකට පලා ගියහ. අනෙක් අතට ඔවුන් තම සන්තක ප්‍රදේශය ආරක්ෂා කිරීමට තීරණය කළේ නම් සටනක් ඇති වීම නොවැළැක්විය හැකි විය. එහෙයින්, කෘෂිකර්මාන්තයත් සමග ආහාර සම්පාදනය ඉහළ ගිය අතර ගෝත්‍රයක වූ ජන සංඛ්‍යාවේ ද ඉහළ යාමක් දක්නට ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස යුද්ධ ඇතිවීමද ස්ථිර දෙයක් බවට පත් වුණි. මෙය මානව සමාජ ඉතිහාස පරිණාමය පිළිබඳ එක්තරා දෘෂ්ටියකි.

කෘෂිකාර්මික අවධිය තුළ මානව ජනගහනය සංඛ්‍යාත්මක අතින් විශාල ලෙස වැඩි විය. දඩයම් යුගය තුළ අනවරතව ලැබෙන ආහාර සැපයුමක් නොවීය. දඩයක්කරුවෙකු හට තමන්ට සතෙකු දඩයම් කර ගැනීමට හැකිවේද යන්න පිළිබඳ සහතිකයක් නොවීය. පලතුරු සහ ඇට වර්ග මෙන්ම ආහාරයට ගත හැකි අනෙකුත් දෑ සොයාගැනීම පිළිබඳ ගැටළු පැවතිණි. කෘෂිකර්මාන්තයෙහි සංවර්ධනයත් සමග අනවරත, සුරක්ෂිත, අධික ආහාර සම්පාදනයක් දක්නට ලැබිණි. එනිසා ජන සංඛ්‍යා වර්ධනයක් සිදු වුණි. සංවර්ධිත කෘෂිකර්මය මගින් අනවරත ආහාර සම්පාදනයක් සහතික කිරීමත් සමගම මානව සමාජය තුළ වූ සමහර සාමාජිකයන්ට ආහාර නිෂ්පාදන ක්‍රියාවලියෙන් නිදහස් වීමට අවස්ථාවක් ලැබිණි. මෙය ශ්‍රම විභජනයකට මග පෑදුවේය. සමහරු ක්ෂේත්‍රයේ සාමූහික දැනුම වැඩිදියුණු කිරීමෙහිලා වෙහෙසුනහ. එක්තරා අවස්ථාවක ලිවීමේ කලාව සොයාගන්නා ලද අතර ඒත් සමගම මිනිසුන්ගේ ජීවන මට්ටමෙහි ශීඝ්‍ර වැඩිදියුණු වීමක් දක්නට ලැබිණි. මානව සමාජ පරිණාමනයෙහි අවධි කිහිපයක් මග හරිමින් විද්‍යා සන්නිවේදනය සහ එහි බලපෑම කෙරෙහි සෘජුව සම්බන්ධ වන්නාවූ අංශයක් දෙස දෑස් අපගේ අවධානය යොමු කරමු. පසළොස්වන (15) ශතවර්ෂයේදී මුද්‍රණ ශිල්පය යුරෝපයේදී ආරම්භ විය. මෙම සොයාගැනීම සඳහා ගෞරවය හිමි කර ගත්තේ ගුටෙන්බර්ග් විසිනි. කෙසේ වෙතත් 15වන ශතවර්ෂයට බොහෝ කලකට පෙර චීනුන් විසින් මුද්‍රණ ශිල්පයේ විද්‍යාව හා කලාව සොයාගත් බවට සාක්ෂි ඇත. මානව සමූහ අතර විශාල පරිමාණයෙන් සන්නිවේදනය ආරම්භ කෙරුණේ මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමත් සමගය. විද්‍යාත්මක දැනුම නොව ආගම පැතිරවීම සඳහා මුල්කාලයේදී මුද්‍රණ ශිල්පය භාවිතයට ගන්නා ලදී. බයිබලය මුද්‍රණද්වාරයෙන් එළි දැක්විණි. ලේඛනය, පුවත්පත් කලාව සහ සන්නිවේදනයෙහි සියලුම අංග ආගම පැතිරවීම සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ලදී. මුද්‍රණ යන්ත්‍රයෙහි සොයාගැනීමත් සමග උගතුන් විසින් ලියන දෑ පරිශීලනය කිරීමේ අවස්ථාවක් මිනිසුන් හට ලැබිණි. ඇරිස්ටෝටල් විසින් කරන ලද දෑ ප්‍රකාශයට පත් කෙරුණි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහස් පුළුල්ව, එහෙත් සෙමින් පැතිරෙන්නට විය. මහජනතාව අතරින් ප්‍රශ්න පැන නගින්නට විය. ''තනි පුද්ගලයෙකු වෙත අති විශාල බලයක් ගොනු කරන්නේ ඇයි?'' යනාදී ලෙසින් ප්‍රශ්න පැන නැගුණි. මෙලෙසින් ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි වන නැඹුරුතාවයන්ගේ ඇරඹුමද මුද්‍රණාලවල සහ සන්නිවේදනයේ ආරම්භය දක්වා දිව යයි.



**ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය**



**ගැලීලියෝ ගැලීලි**

නූතන විද්‍යාවේ ඉතිහාසය ගැලීලියෝ ගැලීලි මුල් කොට ගෙන යුරෝපයේදී ආරම්භ විය. ගැලීලියෝ 1564දී උත්පත්තිය ලැබූ අතර 1646දී මිය ගියේය. පුරාවෘත්තයන්ට අනුව බර සහ සැහැල්ලු වස්තු නිදහස් පතනය පිළිබඳව ඇරිස්ටෝටල් විසින් උගන්වන ලද දෑ බිඳ දැමීම සඳහා ගැලීලියෝ පීසාහි ඇලවුණු කුළුණට නැග්ග බව සඳහන් වේ. ගැලීලියෝගෙන් පසුව විද්‍යාව මානව ශිෂ්ටාචාරයේ ඉදිරි ගමනට දායක වෙමින් ඉතා වැදගත් සමාජ බලවේගයක් බවට පත් විය. එනිසාම, විද්‍යා සන්නිවේදනයේ බලපෑමක් බටහිර ලෝකයේ මානව සමාජය කෙරෙහි ඇතිවන්නට විය. ''විද්‍යාව'' හෝ ''විද්‍යා'' හෝ ''විජ්ජා'', එකිනෙක හා සම්බන්ධ කොටස් දෙකකින් සමන්විතය. වටහා ගැනීමේ පහසුව සඳහා මේවා එකිනෙකින් වෙන් කර සලකා බලමු. සිද්ධාන්තමය ලෙස ලෝකය නොඑසේනම් විශ්වය දෙස එබී බලන විද්‍යාව පළමුවැන්නයි. මූලිකව ශක්තිය පැවතුණ අතර එහි එක් කොටසක් අනතුරුව පදාර්ථය බවට පරිවර්තනය වීමක් සිදුවූ බව විද්‍යාව අපට පවසයි. අප දැන් හොඳින් දන්නා පරිදි ශක්තියට සහ පදාර්ථයට එකිනෙක අතර පරිවර්තනය විය හැකිය. පරිවර්තනය හටගත්තේ ''මහා පිපිරුමත්'' සමගය. මෙලෙස ඉන්ද්‍රිය විචාරය මගින් මෙහෙයවනු ලබන මානව වර්ගයාගේ පංචේන්ද්‍රිය ආධාරයෙන් යථාර්ථය පිළිබඳව වටහා ගත හැකි වන පරිදි විස්තරයක් විද්‍යාව මගින් සපයනු ලැබේ. එනිසා, විද්‍යාව ''ලෝකය පිළිබඳ දැනුම ව්‍යාප්ත කළ සිද්ධාන්තය'' බවට පත් විය.

දෙවැන්න, එදිනෙදා ජීවිතයේ තිබෙන්නා වූ ලෞකික ගැටළුවලට විසඳුම් ලබා දීමට විද්‍යාත්මක දැනුම යොදාගැනීමයි. මෙය ''විද්‍යාත්මක ශිල්ප ක්‍රමය'' ලෙස හැඳින්විය හැක. වඩාත් කඩිනමින් සහ කාර්යක්ෂම ලෙස

අපගේ කායික සැපතට අවශ්‍ය දෑ තෘප්තිමත් කිරීමෙහිලා භෞතික පරිසරය වෙනස් කිරීම සඳහා අපට මෙමගින් හැකියාව ලබා දෙයි.

ඒ අනුව, ලෝකය පිළිබඳ සිද්ධාන්තයක් සහ ශිල්ප ක්‍රමයක් ලෙස, අපගේ පැවැත්ම, සෞඛ්‍ය සහ සැප පහසුව ප්‍රවර්ධනය කිරීම පිණිස ලෝකය වෙනස් කිරීමට විද්‍යාව අප සතුව ඇත. ලෝකය පිළිබඳ සිද්ධාන්තයක් ලෙස විද්‍යාව යන්නට මානවයා විසින් වැඩි පිළිගැනීමක් ලබා දී නැත. එනමුදු, විද්‍යාව ශිල්ප ක්‍රමයක් ලෙස පුළුල් පිළිගැනීමකට ලක්ව තිබේ. එනිසා, පරිගණක, රූපවාහිනී, රේඩියෝ, මෝටර් රථ, කැමරා හිමි කර ගැනීම සහ ගුවන් යානා මගින් ගමන් බිමන් යෑම, ප්‍රතිජීවක භාවිතය යනාදියට සෑම කෙනෙකුම කැමැත්තක් දක්වයි. මෙම විද්‍යාත්මක සොයාගැනීම් සියල්ලම ඉතා ඉහළින් පිළිගත හැකි ඒවාය.



විද්‍යා සන්නිවේදකයන් ලෙස අපගේ ප්‍රධාන කාර්යභාරය වන්නේ මෙම විද්‍යාත්මක සොයාගැනීම් ක්‍රියා කරන ආකාරය පිළිබඳව එකී ජනයාට පැහැදිලි කිරීමද? නොඑසේනම්, අපගේ ප්‍රධාන කර්තව්‍යය විය යුත්තේ විද්‍යාව ලෝකය කෙසේ දකීද යන්න පිළිබඳ විස්තරයක් සැපයීමද? විද්‍යාත්මක සොයා ගැනීම් ප්‍රවර්ධනය කිරීමට විද්‍යා සන්නිවේදකයින් ප්‍රමුඛත්වය දී කටයුතු නොකළ යුතුය. මක් නිසාද යත් ඒවායේ නිෂ්පාදකයින් සහ වෙළඳ දැන්වීම් ප්‍රචාරකයින් තමන්ට ආවේණික කාර්යක්ෂම විධික්‍රම භාවිතයෙන් අදාළ ප්‍රවර්ධන කටයුතු සිදු කරන බැවිනි. ඒවාට එතරම් ප්‍රචාරයක් ලබා දීමට ද අවශ්‍ය නොවේ. විද්‍යාව ප්‍රායෝගිකව වැඩෙහි යෙදෙන ආකාරය මිනිසුන්ට දැක ගත හැකි වන අතර එනිසාම ඔවුන් ඒවා තම සන්තක කර ගැනීමට සාමාන්‍යයෙන් උත්සුක වනු ඇත. එහෙයින් සන්නිවේදකයින් ලෙස අපගේ ප්‍රධාන කාර්යභාරය විය යුත්තේ ලෝකය පිළිබඳ සිද්ධාන්තයක් ලෙස විද්‍යාව යන්න ව්‍යාප්ත කිරීම සහ විද්‍යාත්මක ක්‍රමය ක්‍රියාවෙහි යෙදෙන්නේ කෙලෙසද යන්න පිළිබඳ අවබෝධයක් මිනිසුන්ට ලබා දීමයි.

මානව වර්ගයා විශ්වය පිළිබඳ දරන මතයෙහි හැඩතල වෙනස් කිරීමට ලෝකය පිළිබඳ සිද්ධාන්තයක් ලෙස විද්‍යාව උපකාර වී ඇත. එමගින් මානව වර්ගයාට විශ්වය තුළ හිමි ස්ථානය පිළිබඳ නැවත තක්සේරුවකට පැමිණ ඇත. ලෝකය පිළිබඳ සිද්ධාන්තය යුරෝපය තුළ පිහිටියේ යුදෙව් - ක්‍රිස්තියානි සම්ප්‍රදායෙහි අංගයක් ලෙසය. කාල් මාක්ස් ලෝකය පිළිබඳ ව්‍යාප්ත කළ සිද්ධාන්තය, එහි ජනප්‍රිය තාර්කික බව, සහ විශ්වකෝෂ සංක්ෂිප්තය ලෙස ආගම විග්‍රහ කළේය. ලෝකය පවතින්නේ කෙසේද? කුමක් සඳහාද? යන්න පිළිබඳ මග පෙන්වීමක් ද එමගින් සැපයිණි. සෑම ආගමක්ම ලෝක දෘෂ්ටියක් සහ ජීවත් විය යුත්තේ කෙසේද යන්න පිළිබඳ ආචාර ධර්ම පද්ධතියක් ඉදිරිපත් කර ඇත. බෞද්ධ සම්ප්‍රදාය තුළ ලෝකය පිළිබඳ සිද්ධාන්තය ''චතුරාර්ය සත්‍යයෙහි'' අන්තර්ග්‍රහණය කර ඇති අතර ආචාර ධර්ම පද්ධතිය ''පංච ශීලය'' මගින් ඉදිරිපත් කර ඇත. මේවා මිනිස් ජීවිතය පිළිබඳ විශ්වකෝෂ සංක්ෂිප්තය මූර්තිමත් කරයි. ක්‍රිස්තියානි දහමෙහි දෙවියන්, පරමාත්මය, දේව කැමැත්ත, ස්වර්ගය, අපාය, සහ දසපනත මගින් එහි විශ්වකෝෂ සංක්ෂිප්තය නියෝජනය කරනු ලැබේ. යුදෙව්-ක්‍රිස්තියානි දෘෂ්ටියට අනුව, ලෝකය එහි සියලුම සත්වයින්, ශාක සහ මිනිසුන් ඔවුන්ගේ වර්තමාන ස්වරූපයෙන්ම මීට වසර 6000කට පෙර, දින හයක් ඇතුළත මවනු ලැබීය. එලෙසම, පෘථිවිය විශ්වයේ කේන්ද්‍රස්ථානය බවද හිරු පොළොව වටා භ්‍රමණය වෙතැයිද ඔවුහු නිගමනය කළහ. මෙම විස්තරය බයිබලයේ පදගතාර්ථ අර්ථකථනයක් මත පදනම්වූ අතර සාමාන්‍යයෙන් මිනිස්සු එය පිළිගත්හ.

මෙකී දෘෂ්ටියට පටහැනිව විද්‍යාව පවසන්නේ විශ්වයේ කේන්ද්‍රස්ථානය පෘථිවිය නොවන බවත් පෘථිවිය සූර්යයා වටා භ්‍රමණය වන බවත්ය. මෙම දෘෂ්ටිය ගැලිලියෝ විසින් විස්තර විභාග කොට දක්වනු ලැබූ අතර රෝමානු කතෝලික පල්ලිය විසින්, එසේ කී දෙය බැහැර කිරීමට ඔහුට බල කරන ලදී. බ්‍රිතාන්‍ය ජාතික තාරකා විද්‍යාඥයකු වූ ජේම්ස් ජීන්ස් සාමිවරයාගේ චිරප්‍රසිද්ධ කියමනකට අනුව පෘථිවිය, ලොව ඇති සියලුම මුහුදුවල තිබෙන වැලි අතරින් එක් වැලි කැටයකින් මිලියනයකින් එකක් තරම් වන බව ප්‍රකාශ කරනු ලැබ ඇත. විශ්වය පිළිබඳ සලකන කල්හි අපගේ ග්‍රහයා එතරම් කුඩාය. නිර්මාණවල අධිපති වූ ද දෙවියන්ගේ පිළිබිඹුවට අනුව මවන ලද්දා වූ ද මිනිසා, දැනට ජීවත් වන වානර සහ වඳුරු විශේෂ 193 දෙනාගෙන් කෙනෙකු බව විද්‍යාව තව දුරටත් පවසයි.

එහෙයින්, විද්‍යාව මගින් විශ්වය පිළිබඳව වූ මානව දෘෂ්ටියෙහි හැඩ තල වෙනස් කරන ලදී. මෙහිදී අනිවාර්යයෙන්ම පැන නැගී ගැටළුව වන්නේ කුමන දෘෂ්ටියක් පිළිගත යුතුද යන්නයි. ආගම මගින් ඉදිරිපත් කළ පොදුවේ පිළිගත් දෘෂ්ටියද නොඑසේ නම් විද්‍යාව මගින් ප්‍රතිශෝධනය කරන ලද දෘෂ්ටියද? මේ නිසාවෙන් ආගම සහ විද්‍යාව අතර ගැටුම් පැන නැගුණි. මෙම විවාදය තවමත් අවසාන වී නොමැත. විද්‍යා සන්නිවේදනයෙහි කාර්යභාරය වන්නේ විද්‍යාවට කීමට ඇත්තේ කුමක්ද යන්න මහජනතාවට ගෙන හැර පෑමයි. වෙනත් අයුරකින් පවසතොත් විද්‍යා සන්නිවේදනයේ

වගකීම වන්නේ විද්‍යාව පිළිබඳව ජනතා අවබෝධය ඇති කරලීමයි. විරප්‍රසිද්ධ ජෛව විද්‍යාඥයෙකු වන ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ රිචඩ් ඩව්කින්ස් විද්‍යාව පිළිබඳ ජනතා අවබෝධය සඳහා මහාචාර්යවරයා වීම මෙහිදී සඳහන් කළ යුතු වඩාත් සිත්ගන්නා සුළු කාරණයකි.

ලෝකය පිළිබඳ මානව වර්ගයා විසින් ලබා ගන්නා ලද වඩාත් විශ්වාසදායක දැනුමෙහි අයිතිය විද්‍යාවට හිමි විය යුතු බවට කිසිදු ගැටළුවක් නොමැත. වර්තමානයේ ලොව පිළිබඳ පිළිගත් සත්‍යය මෙයින් නිරූපණය කෙරේ. එනිසා, නූතන ලෝකයේ සිටින විද්‍යා සන්නිවේදකයෝ කිසිදු අඩුවකින් තොරව විශ්වය පිළිබඳ සත්‍යය මානව වර්ගයාට ප්‍රකාශ කරති. මෙම සත්‍යය සරල නොවේ. විද්‍යාත්මක දැනුම යාවත්කාල කළ යුතු සහ අසම්පූර්ණ වීම කරණ කොට ගෙන මෙකී දෑ අඩුපාඩු සහිත වීම නිසා මෙසේ නිදොස්ද නොවන බව කිව යුතුය. එසේ වූයේ නමුදු මිනිස් වර්ගයා සතු හොඳම දෑ ද මෙයයි. පෙර සඳහන් කළ දෙයක් නැවත කියන්නේ නම්, විද්‍යාව දෙවැදෑරුම් කාර්යයක් ඉටු කරයි. පළමුවැන්න, විද්‍යාවේ සොයාගැනීම් මගින් විශ්වය පිළිබඳව සහ එහි අපට හිමි ස්ථානය පිළිබඳ මිනිස් වර්ගයාගේ දෘෂ්ටියෙහි හැඩතල වෙනස් කිරීමය. දෙවැන්න, අපට දීර්ඝායුෂ ලබා ගැනීමට සහ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට හැකි වන පරිදි විද්‍යාවේ ශිල්ප ක්‍රම මගින් ලෝකය වෙනස් කිරීමයි. බොහෝ මිනිස්සු තම වාසිය තකා ලෝකය වෙනස් කිරීමට විද්‍යාව ශිල්ප ක්‍රමයක් ලෙස යොදා ගැනීම පිළිබඳ උනන්දුවක් දක්වති. මෙය ආශිර්වාදයක් වී ඇති නමුදු අවාසනාවකට එය අමිශ්‍රිත ආශිර්වාදයක් නොවේ. මෙය දෙපැත්ත කැපෙන ආයුධයක් බඳුය. මිනිස් වග වෙත යහපත් කිරීම සඳහා මෙය වැඩි වශයෙන් යොදා ගෙන ඇත. එමෙන්ම, විශාල ලෙස හානි ගෙන දීමට ද එය යොදා ගනු ලැබ තිබේ. විද්‍යාත්මක ශිල්ප ක්‍රමය සැලකූ විට එය යහපත් නොවන අතර අයහපත්ද නොවේ. යහපත් දෙය මෙන්ම අයහපත් දේ කිරීමට එය යොදා ගෙන ඇත. විද්‍යාව ශිල්ප ක්‍රමයක් ලෙස යහපත් දේ සඳහා යොදා ගැනීම සලකා බලන විට, නිරපේක්ෂ දරිද්‍රතාවය අඩු කිරීමට එය උපකාර වී ඇති ආකාරය අපට දැක ගත හැකිය. දීර්ඝ ලෙස මෙන්ම දුෂ්කර පැය ගණනාවක් කායික ශ්‍රමය යොදා ගැනීම 'යන්ත්‍ර' භාවිතය මගින් අඩු කොට ඇත. වෛද්‍ය විද්‍යාවේ දියුණුව ජීවිත අපේක්ෂාව ඉහළ දමා ඇති අතර ළදරු මරණ අනුපාතිකය පහත හෙලා ඇත. ඇඟිලි සලකුණු සහ ඩී. එන්. ඒ. පැතිකඩ යනාදී ශිල්ප ක්‍රම භාවිතයෙන් අපරාධ අනාවරණය කර ගැනීම සඳහා විද්‍යාව මගින් හැකියාව ලබා දී ඇත.

අධ්‍යාපනය පැතිරයාම මගින් අප සියලු දෙනාටම ප්‍රතිලාභ ලැබී ඇත. විශාල ලෙස ග්‍රන්ථ ප්‍රකාශනයට රුකුල් දීම මගින් විද්‍යාව, අධ්‍යාපනය සඳහා උපකාර කර ඇත. සංචාරය එමගින් පුළුල් ලෙස ප්‍රවර්ධනය කර ඇත. 'සංචාරයෙහි යෙදීම මනසට පෘථුල බවක් ලබා දේ' යනුවෙන් ප්‍රසිද්ධ කියමනක්ද තිබේ. සන්නිවේදනය සඳහා විද්‍යාව මගින් පහසුකම් සපයා




ට්‍රයිබල් යුද්ධය

ඇත. නිවෙස් තුළට වී අපගේ ක්‍රිකට් ක්‍රීඩකයන් ලෝකයේ විවිධ ස්ථානවල ක්‍රීඩා කරන ආකාරය අපට දැකගත හැකිය. පසුගිය කාලයේ හුසේන් බෝල්ට්ගේ මීටර 100 සහ 200 විශ්මයජනක තරඟ ජයග්‍රහණය අපගේ නිවස තුළ හිඳගෙන නිදහසේ නැරඹීමට අපට හැකි විය. එය එසේ සිදු කළ හැකි වූයේ විද්‍යාත්මක ශිල්ප ක්‍රමවල මහිමයෙනි.

ප්‍රමාණවත් තරම් උසස් මට්ටමක ඇති ඕනෑම විද්‍යාත්මක ශිල්පයක් මැජික්වලින් වෙන් කොට හඳුනාගත නොහැකි බව, අප රටට ඉමහත් ඇල්මක් දක්වූ 'ශ්‍රීමත් ආතර් සී ක්ලාර්ක්' වරක් ප්‍රකාශ කොට තිබේ. ඇත්ත වශයෙන්ම එය විජ්ජාවක් බඳුය. අප මෙතෙක් සාකච්ඡා කරමින් සිටියේ ශිල්පක්‍රමයක් ලෙස විද්‍යාව යොදා ගැනීමේ යහපත් ප්‍රතිඵල පිළිබඳය. විද්‍යාවට උපලක්ෂිත වූ මානව පීඩනයේ තීව්‍රතාවය පිළිබඳව සලකන විට අපට සිදු වන්නේ ලජ්ජාවෙන් මුහුණ සඟවා ගැනීමය. මෙහිදී මතක තබා ගත යුතුම දෙයක් නම්, විද්‍යාව දුෂ්ට නොවන බවත් එය දුෂ්ට දේ සඳහා මෙහෙය වූ මිනිසුන්ගේ නපුරුකම නිසා එකී ප්‍රතිඵල ඇති වූ බවත්ය. ඒ එසේ වුවත් ගැටුම් මිනිස් ස්වභාවයේම කොටසක් වූ අතර මානව සමාජ කිහිපයක් පමණක් එවැනි තත්වයන්ගෙන් තොර විය. මුල්ම ආයුධ වූයේ දුනු සහ ඊතලයි. මෙම ආයුධවලින් මහත් විනාශයක් සිදු නොවීය. එහෙත් අද මිනිසා විසින් සමූහ විනාශ සිදු කළ හැකි ආයුධ, විද්‍යාවේ පිහිටෙන් නිෂ්පාදනය කරනු ලබයි. ලෝකයේම බලාපොරොත්තු සුන් කරවමින් මහත් විනාශයක් සිදු කිරීමට මෙම ආයුධවලට හැකියාව ඇත. හිරෝෂිමා සහ නාගසාකිවලට හෙලන ලද පරමාණු බෝම්බ එකී නගරවලට මහත් ව්‍යසනයක් ඇති කර දුනි. විද්‍යාව හා තාක්ෂණය අමනෝඥ ලෙස සහ හිතුමතේ භාවිත කිරීම නිසා ප්‍රතිඵලය වූ පරිසර දූෂණය දිගු කාලීන එමෙන්ම බරපතල ගැටළු නිර්මාණය කර ඇත. ඕනෑම ඒකාධිපතියෙකුට තම බලය ස්ථාවර කර ගැනීමට අවශ්‍ය නම් ආයුධවල ස්වරූපයෙන් විද්‍යාව එකී අරමුණ ඉටු කර ගැනීම සඳහා භාවිත කළ හැකිය. මේවා විද්‍යාවේ ශිල්ප ක්‍රමයක් ලෙස භාවිතයෙන් සිදු වන අනිටු විපාකයකි.




සමූල ඝාතක අවි!



විද්‍යා සන්නිවේදනය කෙතරම් ඵලදායී වී තිබේද? එමගින් ඇති වූ බලපෑම කුමන ආකාරයක වීද? ඇත්තවශයෙන්ම මෙම ලිපියෙහි මාතෘකාවද මෙයයි. සිද්ධාන්තයක් ලෙස විද්‍යාව යොදා ගැනීමේ බලපෑම අවමය. විද්‍යාව ලෝකය පිළිබඳ පැවසීමට ඇති දේ පිළිගත්තේ ටික දෙනෙකි. මිහිමත පවතින ජීවයේ විවිධත්වය පිළිබඳ හොඳම විවරණය ඩාවින්ගේ පරිණාමවාදය මගින් ඉදිරිපත් කෙරෙන බව පිළිගත්තේ ඇමරිකානුවන්ගෙන් 15%ක් පමණි. අනෙක් අතට රූපවාහිනී, රේඩියෝ, පරිගණක, ගුවන් යානා, නූතන වෛද්‍ය විද්‍යාව, සහ විවිධ දෑ උද්‍යෝගිමත් ලෙස භාවිත කරන ආකාරය මගින් තීරණය කරන්නා වූ ශිල්ප ක්‍රමයක් ලෙස විද්‍යාව භාවිතයේ බලපෑම අති විශාලය. පරිගණකවලින් සිදු

**අද තරුණ පුරපුර හෙට දවසේ ඔවුන්ගේ ලාභයයිඉ එනිසා, මෙම පුරුද්දට බාලවයස්කරුවන් බිලි බා ගැනීමට ඔවුහු හැකි සියලු ප්‍රයත්න දරති. මෙවැනි සන්දර්භයක් තුළ විද්‍යා සන්නිවේදකයකුගේ සැබෑ කාර්යභාරය කුමක්ද? සහතික වශයෙන්ම ඔබගේ මුළු මහත් ශක්තියම යොදා, මරණය විකුණන වෙළඳුන් ලෙස කුප්‍රකට දුම්කොළ කර්මාන්තකරුවන්ගෙන් අපගේ ඉදිරි පරපුර බේරා ගැනීම සඳහා හැකි සියලුම දේ හැකි වෙර යොදා ඉටු කිරීමය. මෙම සිතුවිලි ඔබගේ ලේ ඇට මිදුළුවලට උරාගන්නා තුරු ඔබ තුළට කාවැද්දවිය යුතුය. අපගේ දරුවන් දුම්කොළ තර්ජනයෙන් බේරා ගැනීමට අඛණ්ඩව සහ කැපවුණු ප්‍රයත්නයක් සහිත යම් ආකාරයක ධූත මෙහෙවරක යෙදීම මගින් ඔබට මහජනතාව කෙරෙහි අතිවිශාල බලපෑමක් සිදු කළ හැකි විද්‍යා සන්නිවේදකයකුගේ තත්වයට ළඟා විය හැකිය.**

කළ හැකි අරුම පුදුම දෑ පිළිබඳව මිනිසුන් තම අත්දැකීමෙන් දන්නා නිසා විද්‍යා සන්නිවේදකයන් වන අප ඒ ගැන ලිවිය යුතු නොවේ. එසේ නම් විද්‍යා සන්නිවේදකයින්ගේ කාර්යභාරය කුමක්ද? අපට සත්‍ය වශයෙන්ම වටහා ගැනීමට ඇත්තේ මෙයයි. සන්නිවේදනයේ වඩාත්ම ඵලදායී ආකාරයක් වන්නේ නිපුණ ලෙස සිදු කෙරෙන වෙළඳ දැන්වීම් ප්‍රචාරයයි. සියලුම ආකාරයේ භාණ්ඩ, සමහරක් යහපත්, සමහරක් අයපත් සහ තනිකරම දුෂ්ට නිෂ්පාදන වූ දුම්කොළ වැනි සමහර දෑ වෙළඳාම් කිරීමට විද්‍යාව භාවිත කරනු ලබයි.

මිනිස් ස්වභාවය සහ සියල්ලන්ටම ප්‍රතිලාභ ලැබෙන ලෙස එය වැඩි දියුණු කළ හැක්කේ කෙසේද යන්න සඳහා සිද්ධාන්තයක් ලෙස විද්‍යාවට කීමට ඇති දෙය සන්නිවේදනය කිරීම පිණිස විද්‍යා සන්නිවේදකයෝ නූතන වෙළඳ ප්‍රචාරණ ශිල්ප ක්‍රම භාවිත කළ යුතු වන්නාහ. පරිගණක ක්‍රියා කරන්නේ කෙසේද? කුමක් සඳහාද? ගුවන් යානා පියාසර කරන්නේ කෙසේද? සහ නැව් වතුර මත ගමන් කරන්නේ කෙසේද? යනාදිය මහජනයාට කීම පමණක් ඇත්ත වශයෙන්ම විද්‍යා සන්නිවේදකයාගේ කාර්යභාරය නොවිය යුතුය.

මෙකී දෑ රසවත් බවට කිසිදු සැකයක් නොමැති නමුදු එවැනි දේ පිළිබඳව විද්‍යා අධ්‍යාපනය වග කියනු ඇත. අනෙක් අතට විද්‍යා සන්නිවේදකයන්ගේ බැරෑරුම්ම වගකීම වන්නේ, දුම්කොළ සහ මාධ්‍යසාරවලින් සිදු කෙරෙන්නාවූ හානිය, ඒඩ්ස් පැතිරෙන ආකාරය, පරිසර දූෂණය සිදුවන ආකාරය, යනාදිය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමයි.

දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියෙහි වර්තමාන සභාපතිවරයා ලෙස කතුවරයාට දුම්කොළවලින් සිදු කෙරෙන හානිය පිළිබඳ නිදර්ශන ඉදිරිපත් කළ හැකිය. පසුගිය ශතවර්ෂය තුළ දුම්කොළ වසංගතය මගින් මිනිසුන් මිලියන සියයක් (100ක්) මරා දමනු ලැබීය. වර්තමානයේ තිබෙන දුම්බීමේ ප්‍රවණතාවය ආපසු හැරවීමට හෝ අත්හිටුවීමට ආණ්ඩු මගින් කිසිවක් සිදු නොකළ හොත් 21වන සියවස තුළ මිනිසුන් මිලියන දහසක් (1000ක්), එනම්, බිලියනයක ප්‍රමාණයක් මෙම වසංගතය මගින් මරා දැමිය හැකි බවට ඇස්තමේන්තු කර ඇත. වෘත්තීමය මට්ටමින් හසුරුවන්නාවූ වෙළඳ ප්‍රචාරණ යන්ත්‍රය තුළින් තම නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම මගින් දුම්කොළ කර්මාන්තය එහි දුෂ්ටත්වය ප්‍රබල ලෙස සමාජය වෙත මුදා හැර ඇත. අද තරුණ පුරපුර හෙට දවසේ ඔවුන්ගේ ලාභයයි! එනිසා, මෙම පුරුද්දට බාලවයස්කරුවන් බිලි බා ගැනීමට ඔවුහු හැකි සියලු ප්‍රයත්න දරති. මෙවැනි සන්දර්භයක් තුළ විද්‍යා සන්නිවේදකයකුගේ සැබෑ කාර්යභාරය කුමක්ද? සහතික වශයෙන්ම ඔබගේ මුළු මහත් ශක්තියම යොදා, මරණය විකුණන වෙළඳුන් ලෙස කුප්‍රකට දුම්කොළ කර්මාන්තකරුවන්ගෙන් අපගේ ඉදිරි පරපුර බේරා ගැනීම සඳහා හැකි සියලුම දේ හැකි වෙර යොදා ඉටු කිරීමය. මෙම සිතුවිලි ඔබගේ ලේ ඇට මිදුළුවලට උරාග

න්නා තුරු ඔබ තුළට කාවැද්දවිය යුතුය. අපගේ දරුවන් දුම්කොළ තර්ජනයෙන් බේරා ගැනීමට අඛණ්ඩව සහ කැපවුණු ප්‍රයත්නයක් සහිත යම් ආකාරයක ධූත මෙහෙවරක යෙදීම මගින් ඔබට මහජනතාව කෙරෙහි අතිවිශාල බලපෑමක් සිදු කළ හැකි විද්‍යා සන්නිවේදකයකුගේ තත්වයට ළඟා විය හැකිය. දුම්කොළ කර්මාන්තකරුවෝ, දුම්කොළ යනු නීත්‍යානුකූල නිෂ්පාදනයක් බවත් එය වැඩිහිටියන් සඳහා වන බවත් යනාදී ලෙස තම අයිතිවාසිකම් ඉදිරිපත් කරති. මෙසේ හෙයින් තමන්ට මෙම ව්‍යාපාරය කරගෙන යෑමේ අයිතිවාසිකමක් ඇති බවද ප්‍රකාශ කරති. මෙම සංක්‍රාන්ති කාලය තුළ එය සිදු වුවත් විද්‍යා සන්නිවේදකයන් නුදුරු අනාගතයේදී මෙය මුලිනුපුටා දැමීමට කටයුතු සිදු කරනු ඇත.

HIV සහිත අවාසනාවන්ත මිනිසුන් හා සම්බන්ධව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීම විද්‍යා සන්නිවේදකන්හට ක්‍රියාත්මක වීමට ඇති තවත් එක් ක්ෂේත්‍රයකි. නිශ්චිතවම HIV ආසාදිත පුද්ගලයන් සමග අප සබඳතා පැවැත්විය යුත්තේ කෙසේද? රෝගයේ ස්වභාවය පිළිබඳ හුදු විස්තරයක් සැපයීම මගින් හෝ ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම මගින් හෝ වැදගත් බලපෑමක් සිදු නොකෙරෙනු ඇත. මෙම කරුණ සම්බන්ධව විද්‍යා සන්නිවේදකයන්ගේ මෙහෙවර විය යුත්තේ මෙකී මිනිසුන් කොට්ඨාශය ඉහත කී මාරාන්තික වෛරසයට අවාසනාවන්ත ලෙස, සමහර විට තමාගේ වරදකින් තොරව ගොදුරු වී ඇති බවත් ඔවුන් සමග සාමාන්‍ය ආකාරයට කටයුතු කිරීම මගින් කිසියම් වූ ලෙසකින් හානියක් නොවන බවත් මහජනතාවට කියා පෑමයි. එකම අනතුර වන්නේ ඔවුන් සමග ලිංගික සම්බන්ධතා පැවැත්වීම පමණි. මෙහිදී HIV පැතිරෙන ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සැපයීම මගින් එම රෝගීන්ට සාමාන්‍ය ආකාරයට සලකන මෙන් අප කළ ආයාචනයට යම් තත්වයක් ලබා දීමට උපකාර වනු ඇත.

අවසාන වශයෙන් වඩා හොඳ සන්නිවේදකයෙකු වීම සඳහා විද්‍යා සන්නිවේදකයන් විසින් අනාගත විද්‍යාත්මක පෙරදැක්මක් සහ ජීවිතය පිළිබඳ ආකල්ප උපදවා ගත යුතුය. අනාගත විද්‍යාත්මක පෙරදැක්මක වටිනාකම කෙබඳුද? මෙම පැනයට පිළිතුරු සැපයීමට නම්, පළමුව අනාගත විද්‍යාත්මක පෙරදැක්ම යනු කුමක්ද යන්න පිළිබඳව පැහැදිලි අදහසක් අප සතුව තිබිය යුතුය. සත්‍යතාවය ඔප්පු කළ හැකි, සත්‍යය මත එළඹෙන නිගමන පදනම් කොට ගත් මානසික පරිචයක් අනාගත විද්‍යාත්මක පෙරදැක්මක් ලෙස හැඳින්විය හැක. අප විශ්වාස කරන බොහොමයක් දේ වෙනුවෙන් පෙනී සිටීමට කිසිම සාක්ෂ්‍යයක් නොමැති බව පෙන්වීමට කුඩා ප්‍රත්‍යවේක්ෂණයක් ප්‍රමාණවත් වේ. නිදසුන් ලෙස, ජීවිතය සාර්ථක වීමට නම් ජ්‍යොතිෂයට අනුකූලව කටයුතු කළ යුතු බව සමහර මිනිස්සු විශ්වාස කරති. එමෙන්ම, විවිධ දෙවිවරුන්ට යාඥා කිරීමෙන් රෝග සුව කළ හැකි බව විශ්වාස කරති. තවදුරටත්, කේන්දර ගැලපෙන්නේ නැති ගැහැනු - පිරිමි එකිනෙකා හා විවාහ නොවිය යුතු බව විශ්වාස කරති. මේ ආකාරයට නිමක් නැති උදාහරණ ඉදිරිපත් කළ හැකිය. මෙකී සෑම අවස්ථාවකදීම යම් විශ්වාසයක් පදනම් වූ සාක්ෂ්‍ය දෙස ඔබ විවේචනාත්මකව බැලුවහොත්, එම සාක්ෂ්‍යයෙහි විචක්ෂණශීලී බවක් නොතිබෙන බව ඔබට වැටහෙනු ඇත. එවැනි අවස්ථාවලදී විද්‍යා සන්නිවේදකයන් කුමක් කළ යුතුද? පහත දැක්වෙන ක්‍රියාමාර්ගය ඔවුන් විසින් තෝරා ගත යුතු බව කතුවරයා යෝජනා කරයි.

**1 පියවර:** හැකිතාක් පැහැදිලි ලෙස සහ නිශ්චිත ලෙස විශ්වාසය සඳහන් කරන්න.

**2 පියවර:** එම විශ්වාසයට ඇති සාක්ෂ්‍ය සලකා බලන්න. එය හුදෙක් ඕපාදූපයක්ද?, එසේත් නොමැති නම් ප්‍රචාරක කාර්යයක්ද? නැතිනම් සම්ප්‍රදායද?

**3 පියවර:** එකී විශ්වාසය සඳහා තිබිය හැකි පැහැදිලි කිරීම සලකන්න. නිදසුනක් ලෙස නැවත උත්පත්තිය හා බැඳුණු සිද්ධියක් හිස්ටීරියාව හා සම්බන්ධ දෙයක් විය හැක.

**4 පියවර:** එකිනෙකට ඇති සාක්ෂ්‍යවලට අයත් විවිධ පැහැදිලි කිරීම් ශ්‍රේණිගත කරන්න.

**5 පියවර:** ස්ථාවර නිගමනයකට එළැඹීමට නොහැකි නම්, හොඳ සාක්ෂ්‍යයක් ඉදිරිපත් වන තෙක් නිගමනයක් කරා එළඹීම අත්හිටුවීම නුවණට හුරුය. එසේ නොවුනහොත්, වඩාත්ම සාක්ෂ්‍ය ඇත්තා වූ විශ්වාසය ඔබගේ ක්‍රියාකිරීමේ උපකල්පනය ලෙස තෝරා ගන්න.

විද්‍යාඥයන් තම කටයුතු සිදු කළ යුතු සැබෑ ක්‍රමය නම් මෙයයි. ගුවන් යානා, නෞකා, සහ පරිගණක නිපදීමට යොදන, දැනුම උත්පාදනය කරන්නාවූ ඔවුන්ගේ ක්‍රමවේදය, බොහොමයක් දෛනික ගැටළු සඳහා උපකාර පිණිස යොදා ගන්නා මෙන් ආයාචනය කළ හැක. මෙම මානසික පරිචය ලබා ගැනීම ඔබට ඵලදායී විද්‍යා සන්නිවේදකයකු බවට පත්වීමට මග පෙන්වනු ඇත. විද්‍යාත්මක ආකල්ප ඔබව විවෘත මනසක් ඇති, එනිසාම, බොහෝ දෑ දරා ගත හැකි කෙනෙකු බවට පත් කරන බව ඔබටම සොයා ගත හැකි වනු ඇත. නූතන ලෝකයට අද වඩාත් අවශ්‍ය ශක්තිය වන්නේ දරා ගැනීමේ ශක්තියයි. එය ඔබ සතු නම්, ඔබ විශාල බලපෑමක් කළ හැකි සන්නිවේදකයකු බවට පත්වෙනු ඒකාන්තය.

**මහාචාර්ය කාලෝ ෆොන්සේකා**



***කොළඹ වෛද්‍ය පීඨයෙහි මෙන්ම උතුරු කොළඹ වෛද්‍ය පීඨයෙහි ද දහසක් වෛද්‍යවරු බිහිකිරීමට දායක වූ කෘතහස්ත වෛද්‍ය මහාචාර්යවරයකු ලෙස හැඳින්විය හැකිය. ලගන්නා ආකාරයෙන් අසීරු විද්‍යා දැනුම සිය ග්‍රාහකයන් වෙත සමීප කිරීම උදෙසා ඔහු තුළ පවත්නා ප්‍රවීණත්වය අති විශිෂ්ටය. මෙතුමා දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියෙහි වර්තමාන සභාපතිවරයායි.***